"ලංකාවේ වවුලන්ටත් කොරෝනා, ඇල්ෆා-බීටා කොරෝනා වැළඳුනු වවුල් වර්ග දෙකක් හමුවේ" යනුවෙන් සිරස්තල සහිත පුවතක් අරුණ පුවත්පත (06/25) ඔස්සේ පළවී තිබිණි. මෙහිදී කොළඹ විශ්වවිද්‍යාලය සහ ජර්මනියේ රොබට් කොක් ආයතනය ඒකාබද්ධව සිදුකළ පර්යේෂණයක් සම්බන්ධයෙන් වැඩිදුරටත් කරුණු දැක්වී තිබිණි. මේ අතර, මෙම පුවතම මව්බිම පුවත්පතේ (06/29) පළව තිබුණේ "වවුලන්ට කොරෝනා?" යන සිරස්තලයෙනි.

සැබවින්ම කොරෝනා යනු වෛරස විශාල ගණනකින් හෙබි වෛරස පවුලකි. එම පවුලේ කොරෝනා වෛරසයන් ප්‍රධාන වශයෙන් ඇල්ෆා, බීටා, ගැමා සහ ඩෙල්ටා ලෙසින් වෙන් කෙරේ. නමුත්, එය ලෝක සෞඛ්‍ය සංවිධානයෙන් මෑතකදී කොවිඩ්-19 ඇති කරවන සාර්ස්-කොව්-2 වෛරස ප්‍රභේදයන් හැඳින්වීමට ඉදිරිපත් කළ නාමකරණයෙන් වෙනස් වේ. එහිදී වවුලන් අතරින් සොයා ගත් ඇල්ෆා සහ බීටා කොරෝනා වෛරසයන්, කොවිඩ්-19 තත්වය ඇතිකරවන සාර්ස්-කොව්-2 වෛරසය හා පටලවා නොගත යුතු අතර, වවුලන්ගෙන් මිනිසුන්ට කොරෝනා බෝ වන බවක් මෙතෙක් විද්‍යාත්මකව තහවුරු කරගෙන නොමැති බවද කියැවේ.

ඉහත කරුණු කාරණා මෙම ලිපි දෙකේම අන්තර්ගතය තුළද විස්තර කොට ඇත.

නමුත්, කොවිඩ්-19 තුන්වන රැල්ල හා සටන් වදිමින් සිටින මේ මොහොතේදී අරුණ සිරස්තලය කියවන්නන් තුළ අනවශ්‍ය භීතියක් ජනිත නොවනු ඇතිදැයි අපට විමසීමට සිදුවේ. එම සිරස්තලය තාක්ෂණිකව ගත් විට සාවද්‍ය නොවන නමුත්, කොවිඩ්-19, සාර්ස්-කොව්-2, කොරෝනා යන යෙදුම් වල වෙනස්කම් නොදන්නා සාමාන්‍ය අයෙකු පහසුවෙන්ම මෙය පටලවා ගැනීමට හැකි නොවේද? ඊට අනුව බලන විට ප්‍රශ්නාර්ථයක් සමගින් ඉදිරිපත් වී ඇති මව්බිම සිරස්තලය වඩාත් සාර්ථක යැයි ඔබ සිතන්නේද? මේ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaNews #Mawbima #Aruna